# අවතරණ චාරිත්‍රවලින් හෙළිවන බෞද්ධාමික නැඹුරුව පිළිබඳ අධ්‍යයනයක්
## (තෝරාගත් අවතරණ විධි ඇසුරෙනි)

ආර්. එම්. ඩී. එරංග ප්‍රමුදිත් පෙරේරා[1]

### හැඳින්වීම

පුද්ගල ජීවිතයේ උපතේ සිට මරණය දක්වා සිදුවන වැදගත් අවස්ථා අවතරණ, චාරිත්‍ර ලෙස හඳුන්වනු ලබයි. සිංහල ජනශ්‍රැතිය සහ ජන ජීවිතය තුළ මෙම අවතරණ අවස්ථා පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. අවතරණ විධි ලෙස උපත, මල්වරය, විවාහය, මරණය යන අවස්ථා මූලිකව දැක්විය හැකි ය. මෙම අධ්‍යයනය මගින් මූලික අවධානය යොමුකරනු ලබන්නේ උපත, විවාහය හා මරණය යන අවතරණ විධිවලින් හෙළිවන බෞද්ධාගමික නැඹුරුව පිළිබඳයි. අතීතයේ සිට වර්තමානය දක්වා මෙම අවතරණ චාරිත්‍ර අනුක්‍රමයෙන් විකාශනය වී ඇත. සිංහල බෞද්ධාගමික නැඹුරුතාවය කොතෙක් දුරට මෙම අවතරණ අවස්ථාවන්හි නිරූපණය වන ආකාරය සහ ඒවා කොතෙක් දුරට ලාංකේය ජන ජීවිතය හා බැඳි අත්‍යන්ත සබඳතාවයකින් යුතුව පවතින්නේ ද යන්න මෙමගින් අධ්‍යයනයට ලක් කරනු ලැබේ.

### පර්යේෂණ විධික්‍රමය

මෙම පර්යේෂණය මූලික වශයෙන් පුස්තකාල පරිහරණය මගින් ග්‍රන්ථ, සඟරා සහ වෙනත් වාර්තා ආශ්‍රය කර ගනිමින් සිදු කෙරෙයි. ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහභාගී නිරීක්ෂණය යන ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රම මගින් දත්ත සම්පාදනය කරගනු ලබන අතර, දත්ත ඉදිරිපත් කිරීම සඳහා ලේඛන මාධ්‍ය භාවිතා කරනු ලැබේ.

### පර්යේෂණ ගැටලුව

උපත, විවාහය හා මරණය යන අවතරණ චාරිත්‍රවලින් බෞද්ධාගමික නැඹුරුව කොතෙක් දුරට ඉස්මතු වන්නේදැයි අධ්‍යයනය කිරීම.

### අධ්‍යයනයේ වැදගත්කම

- අවතරණය චාරිත්‍රවලින් හෙළිවන බෞද්ධාගමික නැඹුරුතාව අධ්‍යයනය කිරීම.

---

[1] විශේෂ ශාස්ත්‍රවේදී උපාධි අපේක්ෂක, සිංහල අධ්‍යයනාංශය, රුහුණු විශ්ව විද්‍යාලය මාතර, erangapramudith@gmail.com

- ❖ අවතරණ චාරිත්‍රවලින් හෙළිවන බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර නිවැරදි ව යොදාගන්නා ආකාරය පැහැදිලි කිරීම.
- ❖ බෞද්ධාගමික නැඹුරුව මෙම අවතරණ අවස්ථා සමග කොතෙක් දුරට බැඳී පවතින්නේ ද යන්න විමර්ශනය කිරීම.

**සාකච්ඡාව**

ලාංකේය ජන ජිවිතය හා බැඳුණු මෙම අවතරණ අවස්ථා තුළ බෞද්ධාගමික නැඹුරුව මැනවින් ඉස්මතු වී පෙනෙයි. ජීවිතයේ සුභ කටයුතු සියල්ලක් ම ආරම්භ කරනු ලබන්නේ බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලබා ගනියි. මෙම අවතරණ විධිවලින් උපත, විවාහය හා මරණය යන අවස්ථාවන් මූලික කරගනිමින් සිදුකරන මෙම අධ්‍යයනයේ දී පැහැදිලි ලෙස බෞද්ධාගමික ලක්ෂණ අන්තර්ගත වන බව ප්‍රත්‍යක්ෂ වේ.

දරුවකු කුස තුළ පිළිසිඳ ගත් මොහොතේ සිට දරුවා ඉපදීම හා ඒ ආශ්‍රිත කාල පරාසය, උපත හා සම්බන්ධ අවස්ථා ලෙස හැඳින්විය හැකි ය. දරු පිළිසිඳ ගැනීමෙන් පසු සෙත් පැතීම, බෝධි පූජා පැවැත්වීම, භාර හාර වීම වැනි ක්‍රියාදාමයන් දැකිය හැකි ය. එසේ ම දරුවා බිහිකිරීමට ආසන්න කාල සීමාව වන විට බෝධි පූජා පවත්වා භික්ෂුන් වහන්සේලා ලවා අංගුලිමාල පිරිත ඇතුළුව සෙත් පිරිත් සජ්ඣායනය කරගනු ලැබේ. එසේ ම දරුවා ඉපදී ටික කාලයක් ගත වූ පසු දොරට වැඩුම නම් චාරිත්‍රය සිදු කරනු ලබන්නේ ද විහාරස්ථානයකට දරුවා රැගෙන යාමෙනි. මෙහි දී ද බෞද්ධාගමික සංකල්පය අනුව බෝධි පූජා පවත්වා පිරිත් නූල් ගැට ගසා සෙත් ශාන්ති සිදු කරනු ලබයි. එ බැවින් උපත හා සම්බන්ධ අවතරණ අවස්ථාවේ දී බෞද්ධාගමික ලක්ෂණ අන්තර්ගත ව ඇත.

එසේ ම ජීවිතයේ තවත් වැදගත් අවස්ථාවක් වන විවාහය තුළ ද මෙම බෞද්ධාගමික නැඹුරුතාව ඉස්මතුව පෙනෙ යි. එහි දී විවාහ මංගල්‍යයට පෙරදින හෝ ඊට පෙර ආසන්න දිනයක දී මනමාලියගේ නිවසේ දී මහා සංඝරත්නය වඩමවා සංඝගත දක්ෂිණාවක් පිරිනමනු ලැබේ. මෙයට මනමාලයා ද සම්බන්ධ වේ. දන් වළඳා අවසානයේ දී නව විවාහ අපේක්ෂිත යුවළට මහා සංඝරත්නය විසින් සෙත් පිරිත් දේශනා කොට ඉදිරි ජීවිතය සාර්ථක කර ගැනීමට ධර්මානුකූල ව අවවාද අනුශාසනා ලබා දෙනු ලබයි. එසේ ම විවාහ මංගල උත්සවය දින වැදගත්ම අංගය ලෙස සලකනු ලබන්නේ මංගල පෝරුවයි. මෙම මංගල පෝරුව සිදුහත් කුමාරුගේ හා යශෝධරා කුමරියගේ විවාහ මංගල්‍යය දක්වා අතීතයකට අපව රැගෙන යනු ලබයි. එම පෝරුව නිර්මාණය කරනු ලබන්නේ ද යම්කිසි ආගමික පදනමක් මතය. එසේ ම නව යුවළ පංචශීලයෙහි පිහිටුවා, ජයමංගල ගී ගායනය, පුරාණ මංගල අෂ්ටක ගායනය තුළින් මෙහි ඇති බෞද්ධාගමික නැඹුරුතාව අපට ප්‍රත්‍යක්ෂ වේ.

ජීවිතය කෙළවර කරන මරණය නම් අවස්ථාව තුළ ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ චාරිත්‍ර වාරිත්‍ර සිදු කරනු ලබයි. අවමංගල්‍ය චාරිත්‍රවල දී විශේෂ අවධානයක් යොමුකරන කටයුත්තක් ලෙස පාංශුකූල චාරිත්‍රය හැඳින්විය හැකි ය. සිංහල බෞද්ධයන් වශයෙන් මළගිය තැනැත්තාගේ හෝ තැනැත්තියගේ පරලොව ජීවිතය සාර්ථක කරවනු වස් මෙම චාරිත්‍රය සිදු කරනු ලබයි. බෞද්ධයන්ගේ අවමංගල්‍යයක දී අවසන් කටයුතු සිදු කෙරෙන දිනයේ භික්ෂූන් වහන්සේලා නිවසට වඩමවා ත්‍රිවිධ රත්නයේ සරණ ගොස් දැහැත්, ගිලන්පස, මතකවස්ත්‍ර පූජා කොට අනිත්‍ය ප්‍රතිසංයුක්ත ගාථා ශ්‍රවණය කිරීම තුළින් දාන ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා මගින් ලැබෙන කුසලය මළගිය ඥාතියාට අනුමෝදන් කරනු ලබයි. එසේ ම මරණයෙන් පසු ව පවා සත්දින, තෙමස් පූර්ණ, වර්ෂ පූර්ණ ආදී පිංකම් කිරීමෙන් මියගිය ඥාතියාට පිං අනුමෝදන් කරනු ලබයි. එමගින් මියගිය තැනැත්තාගේ හෝ තැනැත්තියගේ පරලොව ජීවිතය සුඛිත මුදිත කිරීම අපේක්ෂා කරනු ලබයි.

මේ අයුරින් බලන කල උපත, විවාහය හා මරණය යන අවතරණ විධි තුළින් සිංහල බෞද්ධාගමික නැඹුරුතාවය මැනවින් ප්‍රකට වන බව අපට මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කහඳගම, සන්ධ්‍යා. (1999). *ජීව දානයෙන් මතක දානයට.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර. (2003). *උපතේ වගතුග.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාරත්න, පී. එම්. (2000). *ශ්‍රී ලංකාවේ අවමංගල්‍ය චාරිත්‍ර.* කොළඹ: එම්. ඩී. ගුණසේන සමාගම.

සේනාරත්න, පී. එම්. (2000). *ශ්‍රී ලංකාවේ විවාහ චාරිත්‍ර.* කොළඹ: එම්. ඩී. ගුණසේන සමාගම.